Australian Government

Fair Work OMBUDSMAN

# භාෂා සහාය

2009 ජුලි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඕස්ට්‍රේලියානු රාජකාරී ස්ථාන සම්බන්ධතා පිළිබඳ නීතියේ වෙනස්කම් සිදුවේ.

මෙම නීති මගින් සේවයේ යෙදී සිටින අයගේ අයිතිවාසිකම් සහ වගකීම් පැහැදිලි කරදේ.

මෙම වෙනස්කම් ඕස්ට්‍රේලියාවේ රාජකාරී ස්ථාන බොහෝමයකට අදාලවේ.

මෙම අයිතිවාසිකම් සහ වගකීම්වලින් සමහරක් නම්:

- සේවකයන් විසින් ලැබිය යුතු වේතන
- නිවාඩු හිමිකම් සහ සේවා කොන්දේසි
- සේවායෝජකයන් විසින් තැබිය යුතු වාර්තා
- සේවය කරන විටදී ගැටළුවක් ඇතිවුවහොත් සේවකයන් සහ සේවායෝජකයන් හට උපකාර ලබා ගත හැකි ආකාරය
- ජාතිය, ගැහැණු පිරිමි බව, ලිංගිකත්වය, වයස, කායික හෝ මානසික ආබාධ හෝ විවාහක තත්වය මත වෙනසකට ලක් නොකිරීම.

## උදව් ලබා දිය හැක්කේ කා විසින්ද?

නව රාජකාරී ස්ථාන සබඳතා ක්‍රමය යටතේ සංවිධාන 2 ක් ඇත.

එවානම් Fair Work Australia සහ Fair Work Ombudsman ය.

Fair Work Australia යනු ජාතික රාජකාරී ස්ථාන සබඳතා විනිශ්චය සභාවයි. මෙය පහත සඳහන් විවිධ ආකාරයේ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලතල ඇති ස්වාධීන ආයතනයකි:

- අවම වැටුප් සම්බන්ධ ආරක්ෂක දැල සහ සේවා කොන්දේසි
- සාමූහික කේවල් කිරීම
- වෘත්තීය සමිති ක්‍රියාමාර්ග
- ආරවුල් විසඳීම
- සේවය අවසන් කිරීම
- වෙනත් රාජකාරී ස්ථාන කටයුතු.

Fair Work Ombudsman මගින්:

- ඕස්ට්‍රේලියානු රාජකාරී ස්ථාන නීති සම්බන්ධයෙන් උපදෙස් සහ දැනුම ලබාදේ
- ජාතික රාජකාරී ස්ථාන නීති අනුව කටයුතු කිරීම අධීක්ෂණය සහ ඒ සම්බන්ධ කඩකිරීම් විමර්ෂණය කිරීම සිදු කරයි
- රාජකාරී ස්ථාන සම්බන්ධ අයිතිවාසිකම් සහ වගකීම පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම සිදු කරයි
- කුඩා ව්‍යාපාර සඳහා මෙවලම් සහ තොරතුරු සපයාදේ.

## වැඩි විස්තර අවශ්‍යයද?

- තොරතුරු අංක 13 13 94 ඔස්සේ Fair Work හා සම්බන්ධවන්න.
- පරිවර්තන සඳහා, දිනකට පැය 24 පුරාත් සතියකට දින 7 ක් පුරාත් ප්‍රාදේශීය දුරකථන ගාස්තුවට අංක **131 450** ඔස්සේ පරිවර්තන සහ තෝල්ක සේවාව **(Translating and Interpreting Service (TIS))** අමතන්න.

**Fair Work Infoline:** 13 13 94 **www.fairwork.gov.au**

This information has been provided by the Fair Work Ombudsman as general guidance only and should not be treated as legal advice. The relevant law is set out in the Fair Work *Act 2009* and the Fair Work *Regulations 2009*.

**Last updated:** 1 July 2009

© Copyright Fair Work Ombudsman